


සනුලයා සවින්දි සංජානා දිසානායක

5 ශ්‍රේණිය - D

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් 'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි

මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළසාහිත්‍ය 2023'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත ජීවිතයට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලයමහනුවර -ර

2023.1 1.16

# අකීකරු හා පැංචා

කඳු මිටියාවතකින් වට වූ ඇල දොල ගලා බසින හරිම ලස්සන ගම්මානයක් ළග ලොකු කැලෑවක් තිබුණා. ඒ කැලෑවේ අලි, කොටි, වලස්සු සහ සිංහයින් වැනි ලොකු සතුන් වගේම මුවන්, හාවන්, මීමින්නන් , කුරුල්ලන් වැනි අහිංසක පොඩි සතුන් ද ඉතා සතුටින් ජීවත් වුණා.



කැලෑව තුළ ජීවත් වුණ සතුන් අතර සුදුම සුදු හරිම ලස්සන හා පවුලක් හිටියා. මේ හා පවුලේ සාමාජිකයන් වුනේ හා අම්මයි, හා තාත්තයි, හා පැටවු දෙන්නයි. හා පැටවු දෙන්නාගෙන් වැඩිමහල් පැටියාගේ නම තමයි සිංදු. පොඩි හා පැංචගේ නම තමයි බිංදු.

බිංදු හරිම කීකරු හා පැංචෙක්. එයා අම්මයි තාත්යි කියන දේ හොඳින් අහනවා. එයාලට උදව් කරනවා.නමුත් සිංදු දෙමාපියන් කියන කිසිම දෙයක් අහන්නේ නැති හරිම අකීකරු හා පැංචෙක්. අම්මටයි තාත්තටයි කිසිම උදව්වක් කරන්නෙත් නෑ. තමන්ගේ මල්ලිත් එක්ක හැම වෙලාවෙම රණ්ඩු කරනවා. මේ නිසා සිංදු නිතරම වගේ එයාගේ තාත්ගෙන් බැනුම් අහනවා.

එක දවසක් කැලේට හොඳටම වහිනවා. කැලේ සතුන් හැමෝටම වගේ තම තමන්ගේ වාවස්ථාන ඇතුලට වෙලා ඉන්න සිදු වුනා. හා පවුලටත් ඔවුන්ගේ නිවෙස තුලට වෙලා ඉන්න සිදු වුනා. දැන් හවස් වෙන්නත් ළගයි. ඒත් වැස්ස. හා පැටව් දෙන්නටම වගේම අම්මටයි තාත්තටයි හොඳටම බඩගිනියි. ගෙනාපු උදුපියලියත් ඉවරවෙලා තිබුණ නිසා ගේ ඇතුලේ කෑමට මොනවත් තිබුණෙත් නෑ.

ටික වෙලාවකින් වැස්ස අඩු වෙන්න පටන් ගත්තා. බඩගින්නේ ඉන්න තම දරුවන්ට කන්න ගෙනත් දෙන්න ඕන නිසා අම්මයි තාත්තයි කෑම සොයා ගෙන එන්න කැලෑව තුලට යන්න සූදානම් වුනා. යන්නට පෙර අම්මා සිංදුට කතා කරලා කීවා ලොකු පුතේ තාත්තයි මායි වැස්ස පායලා තියෙන අතරේ ඔයාලට කෑම සොයා ගෙන එන්න යනවා. අපි එනකම් රණ්ඩු කරන්නේ නැතිව මල්ලිත් බලා ගෙන ගේ ඇතුලටම වෙලා ඉන්න  කියලා. පසුව අම්මයි තාත්තයි ගෙදරින් පිටත් වුණා.



අම්මයි තාත්තයි ගිහින් ටික වෙලාවත් යනකොට සිංදුගේ බඩගින්න එන්න එන්නම වැඩි වුණා. සීතල නිසා බිංදු ඇදේ ගුලි වෙලා හොදටම නිදි. සිංදුට හිතුණා මල්ලිත් හොදටම නිදි නිසාත් වැස්ස පායලා තිබුණ නිසාත් කන්න මොනවාහරි හොයා ගන්න එලියට යන්න ඕන කියලා.එහෙම හිතපු සිංදු තමන්ගේ මල්ලි බිංදු තනිවම නිවසේ සිටියදී දොර වහලා යන්න පිටත් වුණා. ගෙදරින් එලියට ආපු සිංදු කල්පනා කලා කෑමට සොයාගන්නෙ මොනවද කියලා.

එතකොටම සිංදුට මතක් වුණා කැලෑව මායිමේ ඇති ගම්මානයේ ගොවියෙකුට අයිති කැරට් ගොවිපල. ඒ සැණින් සිංදු කැරට් පාත්තිය තියෙන පැත්තට දිව්වා. කැරට් පාත්තිය ළගට ගිය සිංදු හොදට වටපිට බැලුවා. කවුරුත් පේන්න නැති නිසා කැරට් පාත්තියෙන් කැරට් අල කිහිපයක් ගලවා ගෙන බඩ පිරෙන්න කෑවා.

මල්ලිටත් කැරට් අල කිහිපයක් අරගෙන යන්න හිතුනත් තමන් කරපු වැරදි වැඩේ අම්මටයි තාත්තටයි අහුවෙන නිසා ඒ අදහස අයින් කරලා දැම්මා. ඊට පස්සේ අම්මයි තාත්තයි එන්න පෙර ගෙදර යන්න ඕන කියලා හිතලා නැවත ඉක්මනින් එන්න පිටත් වුණා.



ටික දුරක් එන විට වැඩිපුර කැරට් කාලා බඩ පිරුණු නිසා සිංදුට නිදිමතක් දැණුනා. ඒ නිසා ළඟම තිබුණු මාදං ගසක් පාමුල ගසට හේත්තු වෙලා නිදා ගත්තා. මේ අතර නිවසේ නිදාගෙන සිටි බිංදුට ඇහැරිලා අයියට කතා කරත් අයියා ගේ ඇතුලේ නෑ කියලා බිංදුට දැණුනා.

අම්මයි තාත්තයි තාම ඇවිල්ලත් නැති නිසා බිංදු හොටම බය වෙලා අඬන්න පටන් ගත්තා. එතකොටම දොර ඇරෙන ශබ්දයක් ඇහුණු නිසා බිංදු ඒ පැත්ත බලනකොටම අම්මයි තාත්තයි ඇවිත්.

බිංදු ඉක්මනට අම්මයි තාත්තයි දෙන්නා ළගට දුවගෙන ගියා. අයියා ගෙදර නෑ මාව තනියම දාලා කොහේදෝ ගිහිල්ලා කියලා. හා අම්මයි තාත්තයි හොදටම කලබල වුණා. සිංදු ගෙදර නැති නිසා. අනෙක ඒ වන විට වටින් පිටින් කලුවර වෙලා රෑ බෝවෙමින් තිබුණේ. තම ලොකු පුතා නැති දුකින් කලබල වූ හා අම්මයි තාත්තයි බිංදුට ගේ ඇතුළටම වෙලා ඉන්න කියලා දොර වහලා සිංදු හොයන්න පිටත් වුණා.

මාදං ගහ පාමුල නිදාගෙන හිටපු සිංදුට එකපාරටම ගොරවන හඩක් ඇහිලා ඇහැරුණා. වටපිට බලන විට හොදටම කලුවර වෙලා. ගොරවන හඩක් ළග ළගම ඇහෙන්න පටන් ගත්ත නිසා සිංදු ඒ පැත්ත බැලුවා.

ලොකුම ලොකු කොටියෙක් මුවෙක් පසුපස දුව යනවා දැකලා සිංදු හොදටම බයවෙලා ගෙවල් පැත්තට දුවන්න පටන් ගත්තා. කලබලෙන් දුවන සිංදු ටික දුරක් දුවන විට මඩ වලකට වැටුණා. එතනින් ගොඩට එන්න උත්සහ කලත් ගොඩට එන්න සිංදුට බැරිවුනා. සිංදු බයවෙලා වට පිට බල බල හොදටම ඇඩුවා.



හා අම්මයි තාත්තයි සිංදු හොයමින් කැලේ හැමතැනම ඇවිදිනවා. හා අම්මා හොදටම අඩනවා. හා තාත්තටත් හරිම දුකයි. සිංදුට නපුරු සතෙකුගෙන්වත් කරදරයක්වත් වෙලා ද කියලා අම්මයි තාත්තයි ගොඩක් බයවෙලා හිටියේ.

මෙහෙම සිංදු සොයමින් යනකොට කෙදිරිගාන හඩක් ඇහෙන්න පටන් ගත් නිසා හා අම්මයි තාත්තයි ඒ පැත්තට ඉක්මනින් දුවලා ගියා. එතකොටම දැක්කා සිංදු මඩ වලක වැටිලා ඉන්නවා. හා අම්මයි තාත්තයි දෙන්නම එකතු වෙලා සිංදු ගොඩට ගත්තේ බොහොම අමාරුවෙන්. කැලෑවේ මැද්දෙන් ගලා යන කුඩා දිය පහරෙන් සිංදුගේ මඩ සෝදලා හා අම්මයි තාත්තයි සිංදු ඉක්මනට ගෙදරට කැදවාගෙන ආවා.



අම්මයි තාත්තයි එක්ක සිංදු එනවා දුක්ක බිංදු මල්ලී හිනාවෙලා උඩ පැන්නා සතුට වැඩිකමට. සිංදු තමන් කරපු වැරැද්දට හා අම්මගෙන් සහ හා තාත්තගෙන් වැදලා සමාව ගත්තා. ආයේ කිසිම දවසක වැරදි වැඩ නොකරන බවටත් යහපත් හොද දරුවෙකු වන බවටත් සිංදු අම්මයි තාත්තයි ඉදිරියේ පොරොන්දු වුණා. ආයේ කිසි දවසක බිංදු මල්ලිත් එක්ක රණ්ඩු නොවී සමගියෙන් සෙල්ලම් කරන්නත් , කම්මැලි දරුවෙකු නොවී පාසල් ගොස් හොදින් ඉගෙන ගන්නත් සිංදු පොරොන්දු වුණා.

බිංදු වගේම සිංදුත් ගුණ යහපත් දරුවෙක් වුණ නිසා හා අම්මටයි හා තාත්තටයි හරිම සතුටුයි. ඒ වගේම මේ හා පවුල හැමදාම සතුටින් ජීවත් වුණා.

පුංචි අපිත් වැරදි වැඩ නොකර දොමාපියන්ගේ, ගුරුවරුන්ගේ, වැඩිහිටියන්ගේ අවවාද හා අනුශාසනා පිළිගනිමින් හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරත වෙමින් සමාජයට වැඩදායී දරුවන් වෙමු.



**පසුවදන**

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතියනව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගා වීමට නූතන තාක්ෂණය හා බැදුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

ජීවය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්,

පාසල් දරුවන් ග්‍රන්ථකරණයටයොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ,

2023.11.16